## 63 – සැලෙන හදින්

සැලෙන හදින් මා තනියම වැලි කතරක් මැද
පා නගන්න බැහැ තනියම ඝන අඳුරක් මැද
රෑ අඳුරේ මා තනි වී පාළු බිමක් මැද
මේ අඳුරේ ඔබ එනවද මගෙ දෙව් සමිඳේ

කතර සරා වෙහෙස වෙලා සොය සොයා යමි
අඳුර සිඳින පහන් එළිය සොයා මම යමි
පහන් දවන හිමි සෙවනේ දිවි ගෙවනෙමි
ගමන පාළු නැහැ සමිඳුනි ඔබ කැටුව එමි

මාර්ගයද ඇත්ත ද ජීවනය මම වෙමි
ඔබ තෙපලූ වදන් අසා ඔබ සොයා එමි
ජීවිතයට ආලෝකය ඔබයි කිතු හිමි
අඳුරෙ දිලෙන පහන් සිළුව ඔබ මගේ දෙව්

අඳුර බිඳන් එළිය අරන් ඔබ එනු දිටිමි
පාළු ගතිය තනිය මකන් ඔබ ගුණ ගයමි
මිනිස් හදත් එළිය කලෝ ඔබ බව දනිමි
පහන දවන් එළිය අරන් ඔබ කරා එමි